# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/22 - 2022 දෙසැම්බර් මස 14 වැනි බදාදා - 2022.12.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ කරනු ලබන නියමය

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර රොෂාන් ගුණතිලක වන මා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 326 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත සඳහන් වූ නියමය මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

**රොෂාන් ගුණතිලක,**
ආර්ඩබ්පී ඇන්ඩ් බාර් වීඑස්වී යූඑස්පී
පීඑච්ඩී (ගෞරව) එෆ්අයිඑම් (ශ්‍රී ලංකා) එන්ඩීසී පීඑස්සී,
මාර්ෂල් ඔෆ් ද ශ්‍රී ලංකා එයාර් ෆෝස්,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

2022 දෙසැම්බර් මස 12 වැනි දින,
බත්තරමුල්ල,
බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ පිහිටි,
බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

1A - PG 6100 — 11 (2022/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**නියමය**

01. කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ මළ ප්‍රවාහන පද්ධතිය වර්ධනය වෙමින් පවතින අපජල සේවාවේ ඉල්ලුම සපුරාලීමට හැකි වන පරිදි හා වඩාත් ගුණාත්මක මළ ප්‍රවාහන සේවාවක් පවත්වා ගත හැකි පරිදි වැඩි දියුණු කිරීම ආසියානු සංවර්ධන බැංකුව, යුරෝපීය ආයෝජන බැංකුව හා ශ්‍රී ලංකා රජය මගින් සපයන මූල්‍ය සහය යටතේ කොළඹ මහා නගර සභාව විසින් දැනටමත් සිදු කරමින් පවතින හෙයින් ද ; ඊට අදාළව ආසියානු සංවර්ධන බැංකුව සමග ශ්‍රී ලංකා රජය අත්සන් කර ඇති ණය ගිවිසුමට අනුව අදාළ සේවාව කොළඹ මහා නගර සභාව පවත්වාගෙන යාමේදී එහි නඩත්තුව හා මෙහෙයුම් සඳහා අරමුදල් සම්පාදනයට අදාළව කොළඹ මහා නගර සභාවට මළ ප්‍රවාහන ගාස්තු අය කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇති හෙයින් ද කරුණු එසේ වුවද ඊට අදාළව මළ ප්‍රවාහනය සේවා පවත්වාගෙන යාම හා අදාළ සේවා ගාස්තු සේවා ප්‍රතිග්‍රාහකයන් වෙතින් කොළඹ මහා නගර සභාව විසින් තීරණය කර අය කිරීමට මහා නගර සභා ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ බලාත්මක විධිවිධාන නොමැති හෙයින් ද, ඒ සම්බන්ධයෙන් කොළඹ මහා නගර සභාවේ පරිපාලනයට අදාළව පැන නැඟී ඇති අනපේක්ෂිත හා විශේෂ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින් මෙම නියමය සිදු කරනු ලබයි.

02. මෙම නියමය කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයට අදාළව කොළඹ මහා නගර සභාව විසින් මළ ප්‍රවාහන සේවාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගාස්තු නියම කිරීමට අදාළ නියමය වශයෙන් හඳුන්වනු ලැබේ.

03. වෙනත් කවර හෝ ලිඛිත නීතියක් මගින් කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය තුළ මළ ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යාම, ඊට ආදළ ගාස්තු නියම කිරීම ඇතුලු ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සලස්වන තෙක් ක්‍රියාත්මක වන පරිදි කොළඹ මහා නගර සභාව විසින් මෙම නියමය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරමින් කොළඹ මහා නගර සභාව විසින් මහා නගර සභා බල ප්‍රදේශ තුළ පවත්වාගෙන යන මළ ප්‍රවාහන සේවා සඳහා ගාස්තු නියම කර අය කිරීම නීත්‍යානුකූල වන්නේය.

04. කොළඹ මහා නගර සභාව ඉහත 3 වන වගන්තිය යටතේ ගාස්තු තීරණය කිරීමේ දී, අදාළ කර ගත යුතු නිර්ණායක බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් තීරණය කළ යුතු අතර, කොළඹ මහා නගර සභාව විසින් මෙම නියමය යටතේ වූ ගාස්තු තීරණය කිරීම පළාත් පාලන කොමසාරිස් විසින් මෙම වගන්තිය යටතේ තීරණය කර නියම කරන නිර්ණායකයන්ට යටත්ව සිදු කළ යුතුය.

05. කොළඹ මහා නගර සභාව විසින් මෙම නියමය යටතේ මහා නගර සභා බල ප්‍රදේශය තුළ මළ ප්‍රවාහන සේවා සඳහා අය කරනු ලබන ගාස්තු ඊට සමාන්තර කාල සීමාවන් තුළ වෙනත් කවර හෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය විසින් මළ ප්‍රවාහන සේවාවන් සඳහා නියම කර අය කරනු ලබන ගාස්තු ඉක්ම නොයෙන පරිදි විය යුතුය.

06. මෙම නියමයෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

EOG 12-0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.